# තනතුරු ඇබෑර්තු

**ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව**

සහකාර පාලක/ ගාස්තු අයකිරීමේ සහකාර/ විදුලි කාර්මික/ සත්ත්ව භාරකරු/ හස්ති භාරකරු තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම - 2026

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ පහත තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ :-

**01.**

| අනු අංකය | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | බඳවා ගැනීමේ සුදුසුකම් | වැටුප් පරිමාණය |
|---|---|---|---|---|
| 01 | සහකාර පාලක (සත්ත්ව/ මත්ස්‍ය/ උරග/ උද්‍යාන) (MN-01) | 02 | ✓ **අධ්‍යාපන සුදුසුකම් -**<br><br>සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව/ ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.<br><br>I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා අංශයෙන් විෂයයන් දෙකක් (02) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම.<br><br>II. පැරණි නිර්දේශය අනුව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා අංශයෙන් විෂයයන් තුනක් (03) සමත් ව තිබීම.<br><br>➢ **වෘත්තීය සුදුසුකම් -**<br>**තනතුරට අදාළව ලබා ඇති වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකමක් සේ සැලකේ.** | රු. 45,230 - 10x540- 11x630 - 10x890 - 10 x 1,190 - රු.78,360/- |
| 02. | ගාස්තු අයකිරීමේ සහකාර (MN - 01) | 02 | ✓ **අධ්‍යාපන සුදුසුකම් -**<br><br>සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව/ ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (1) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.<br><br>➢ **වෘත්තීය සුදුසුකම් - අදාළ නොවේ.** | රු. 45,230 - 10x540 - 11x630 - 10x890 - 10 x 1,190 - රු. 78,360/- |
| 03. | විදුලි කාර්මික ශිල්පී (PL - 03) | 04 | ✓ **අධ්‍යාපන සුදුසුකම් -**<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. | රු. 42,780 - 10x490 - 10x540 - 10x590 - 12x630 - රු. 66,540/- |

| අනු අංකය | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | බඳවා ගැනීමේ සුදුසුකම් | වැටුප් පරිමාණය |
|---|---|---|---|---|
| | | | ➢ **වෘත්තීය සුදුසුකම්**<br><br>විදුලි කාර්මික ශිල්පි - විදුලි කර්මාන්තය සම්බන්ධයෙන් ජාතික වෘත්තීය කුසලතාවයන් හි (NVQ) 4 මට්ටමට අදාළ සහතිකයන් ලබා තිබීම. | |
| 04. | සත්ත්ව භාරකරු (PL - 02) | 10 | ✓ **අධ්‍යාපන සුදුසුකම්**<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.<br><br>➢ **වෘත්තීය සුදුසුකම්**<br><br>අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන් හි (NVQ) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම. | රු. 41,800 - 10x490 - 10x540 - 10x590 - 12x630 - රු. 65,560/- |
| 05. | හස්ති භාරකරු (PL - 02) | 02 | ✓ **අධ්‍යාපන සුදුසුකම්**<br><br>8 වසර සමත් වීම<br><br>➢ **වෘත්තීය සුදුසුකම්**<br><br>අලි ඇතුන් රැකබලා ගැනීම පිළිබඳ දැනුම සහ අලි ඇතුන්ට දේශීය බෙහෙත් කිරීමේ හැකියාව | රු. 41,800 - 10x490 - 10x540 - 10x590 - 12x630 - රු. 65,560/- |

02. බඳවා ගන්නා ක්‍රමවේදය

**පළපුරුද්ද**

i. සහකාර පාලක/ ගාස්තු අයකිරීමේ සහකාර/ විදුලි කාර්මික/ සත්ත්ව භාරකරු/ හස්ති භාරකරු - ඉල්ලුම් කරන තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වසර තුනක (03) පළපුරුද්ද

03. **කායික සුදුසුකම්** : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

04. **වෙනත් සුදුසුකම් :**

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුතු විය යුතු ය.

05. **වයස :**

සහකාර පාලක/ ගාස්තු අයකිරීමේ සහකාර - අයදුම්පත් භාරගන්නා අවසාන දිනට එනම් 2026.02.27 දිනට වයස අවු. 18ට නොඅඩු හා අවු. 30ට නොවැඩි විය යුතු ය.

විදුලි කාර්මික/ සත්ත්ව භාරකරු/ හස්ති භාරකරු - අයදුම්පත් භාරගන්නා අවසාන දිනට එනම් 2026.02.27 දිනට අවු. 18 ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතු ය.

06. **බඳවා ගැනීමේ ක්‍රමය :**

| | | |
|---|---|---|
| සහාකාර පාලක/ ගාස්තු අයකිරීමේ සහකාර | - | ලිඛිත පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| විදුලි කාර්මික | - | වෘත්තීය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| සත්ත්ව භාරකරු/ හස්ති භාරකරු | - | ප්‍රායෝගික හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |

07. **විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :** විභාගය **සිංහල සහ දෙමළ** යන මාධ්‍යයන්ගෙන් පමණක් පවත්වනු ලැබේ.

*සටහන* - අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය. තම ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍ය වෙනස් කිරීමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩදෙනු නොලැබේ.

08. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**

අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත ලේඛනවලින් එකක් සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනයේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

තවද, අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේ දී විමසන ඕනෑම අවස්ථාවක පහත ලියවිලි අවශ්‍ය පරිදි ඉදිරිපත් කිරීමට බැඳී සිටිය යුතු ය.

I. උප්පැන්න සහතිකය,
II. ජාතික හැඳුනුම්පත,
III. අධ්‍යාපන සහතික හා ශිෂ්‍ය කාර්‍ය දර්ශකය,
IV. පළපුරුද්ද පිළිබඳ සහතික,
V. චරිත සහතික දෙකක් (ග්‍රාම නිලධාරී සහතිකය හා පොලිස් වාර්තාව).

***සැලකිය යුතු ය:***

(අ) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් ඇමිණීමෙන් වැළකී සිටිය යුතු ය.

(ආ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වල සහතික ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවක දී එම ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

09. **අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

i. අයදුම්පත් 2026.02.27 දිනට හෝ ඊට ප්‍රථම "අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, දෙහිවල" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළයුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ.

iii. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **"අදාළ තනතුර"** සඳහන් කළ යුතු ය.

iv. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ නීතිඥවරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු හෝ රු. 71,240/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

v. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

10. තනතුරට බඳවා ගැනීම් සඳහා සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවට කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

11. **සාවද්‍ය තොරතුරු සැපයීම** - අපේක්ෂකයෙකුට ඉහත සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. මෙම නිවේදනයේ සඳහන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

***සැ. යු. -*** අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියමය පරිදි අදාළ සම්මුඛ පරීක්ෂණ හා විභාග කොළඹ දිස්ත්‍රික්කයේ දී පමණක් පැවැත්වේ.

රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කර ඇති නිලධාරි කමිටුවේ නියමය පරිදි.

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව.

2026 ජනවාරි මස 08 දින,
දෙහිවල දී ය.